# මලිති සහ මල් පැංචි



ආර්.බී.විෂ්මි ආකර්ෂා

# මලිති සහ මල් පැංචි

ආර්.බී.විජ්මි ආකර්ෂා
2 ශ්‍රේණිය E
මහ/ මහාමායා බාලිකා විදුහල

කතාව සහ චිත්‍ර
ආර්.බී.විජ්මි ආකර්ෂා

ISBN 978-624-206-802-2

කතෘ ප්‍රකාශනයකි
2023

# පිදුම

සිප් සතර කියා දුන්

චාමිනි පල්ලිය ගුරුගේ ගුරුතුමියටත්,

ආදරණීය දෙමව්පියන්ටත්,

මාගේ යෙහෙළියන්ටත්

ඉතා ආදරයෙන්

මෙම ග්‍රන්ථය

පුද කරමි

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහා ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී.දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය-මහනුවර
2023/10/30

එකමත් එක රටක පුංචි ගමක් තිබුණා.
ඒ පුංචි ගමේ වෙල් යායක් මැද පුංචි ගෙයක් තිබුණා.



ඒ පුංචි ගෙදර ජීවත් වුණේ මලිතියි, අම්මයි, තාත්තයි.
ඒ අය ගොඩක් සතුටින් කාලය ගත කළා.



මලිතිගේ තාත්තා කැළයට ගොස් දර කපා දර විකුණාන සල්ලි වලින් ඔවුන් ජීවත් වුණෝ.



දිනක් මලිති තාත්තා සමඟ කැළයට ගියා.
ටික දුරක් යන විට මලිතිට කට හඬක් ඇසුණා.



මලිති පිටුපස බලන විට ඇයට ලස්සන මලක් පෙනුණා.
ළමයා නම මොකක්ද?
මම මලිති, මල් පැංචි



මල් පැංචි සමඟ පුංචි මලිති ගොඩක් සෙල්ලම් කළා. තාත්තට මලිති මල් පැංචි ගැන කිව්වා. ගෙදරට දිව ගොස් අම්මාටද මේ ගැන කිව්වා.



පසු දින උදෑසනින්ම මල් පැංචි බැලීමට අම්මාද, තාත්තාද මලිතිද පිටත් වුණා.


මලිති කැළයට ගොස් මල් පැංචිව හඳුන්වා දුන්නා.

මල් පැංචි හරිම සතුටින් ඔවුන් සමඟ කතා කළා.



මල් පැංචි මලිතිගේ තාත්තාට කිව්වා දර පලන එක බොහොම අමාරුයි.

එහා ගමේ වනාන්තරේ ලස්සන විලක මල් තිබෙනවා ඒවා කඩා නගරයට ගෙන ගොස් විකුණා කාසි සොයා ගන්න.



මල් පැංචි කියූ විදියට මලිතිගේ තාත්තා මල් විකුණා කාසි සොයා ගත්තා.

ඔවුන් බොහෝම සතුටින් කාලය ගත කළා.

මල් පැංචියි මලිතියි බොහෝම හොඳ යාළුවෝ වුණා.





## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස් වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය.පාසල තුළ ගොඩනැගී ඇති ලේකන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟා වීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කරු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු...

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 10 . 30

ISBN 978-624-206-802-2